

කාලෝ රචිත ගී
වෙද සිසු හඬින්......
3 th
ANNIVERSARY
FACULTY OF MEDICIN
UNIVERSITY OF KELAN

# කාලෝ රචිත ගී වෙද සිසු හඬින්

## වැඩසටහන් පෙළගැස්ම

1. ප්‍රවේශය - කාලෝ රචිත ගී වෙද සිසු හඬින්

2. 'සැමරුම් ගීතය'
   පද රචනය : මහාචාර්ය දර්ශන රත්නායක
   ගායනය : වෛද්‍ය පීඨ සිසුන්
   තනු නිර්මාණය : සංගීත විශාරද වෛද්‍ය ශිෂ්‍ය පිෂාල් ඥානරත්න

3. පදාර්ථයට පණ කවා
   මුල් ගායනය : විශාරද එඩ්වඩ් ජයකොඩි
   පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
   සංගීත සංයෝජනය : තිස්සසිරි පෙරේරා

4. රත්තරන් දුවේ
   මුල් ගායනය : ආචාර්ය නන්දා මාලිනී සහ ආචාර්ය රෝහණ වීරසිංහ
   පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
   සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

5. කොයිද කියා මන්ද කියා
   මුල් ගායනය : විශාරද අමරසිරි පීරිස්
   පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
   සංගීත සංයෝජනය : රංජිත් ප්‍රේමවීර

6. සංධ්වනිය 1 (ජීවන අරගලය)
   සංගීත රචනය : සංගීත විශාරද වෛද්‍ය රවිඳු පීරිස්

7. මහාචාර්ය කාලෝ ෆොන්සේකා නිර්මාණ ඇගයීම
   ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න

8. පෙම් සිනා සුන් වුණා
   මුල් ගායනය : ආචාර්ය වික්ටර් රත්නායක
   පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
   සංගීත සංයෝජනය : ආචාර්ය වික්ටර් රත්නායක

9. රුදුරු තුරු වදුලේ
   මුල් ගායනය : විශාරද සුනිල් එදිරිසිංහ
   පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
   සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

10. සංධ්වනිය 2 (උපත)
    සංගීත රචනය : සංගීත විශාරද වෛද්‍ය ශිෂ්‍ය පිෂාල් ඥානරත්න

11. ධනයට ඇයි දැඩි ආශා
    මුල් ගායනය : පණ්ඩිත් අමරදේව සූරීන්
    පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
    සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

12. වෛද්‍ය පීඨ ගීතය
    පද රචනය සහ තනු නිර්මාණය : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
    සංගීත සංයෝජනය : මහාචාර්ය ප්‍රදීප් රත්නායක




# 1. මහදුරු කාලෝ - සැමරුම් ගීය

තිස් වසරක සිය මෙහෙවර සපුරන
වෛද්‍ය පීඨය බැබලේ
එමග සුසරු කළ- මහදුරු කලෝ
සොදුරු ඇදුරු ගුණ සැමරේ

වැජඹී සිට මුල් පුටුවේ
ලොව විදූ ඇසකිනි දුටුවේ
පොඹ කළ ජීවය - සිදූ කළ සේවය
ඇසු දුටු සිත් නෙත් තුටු වේ

කාලෝචිත ගී රාවේ
දස දෙස එක ලෙෂ පාවේ
සියත් දසුන් හා වියත් දෙසුම්
නවලොවකට හිරු සඳු වූවේ

ගායනය : වෛද්‍ය පීඨ සිසුන්
පද රචනය සහ තනුව : මහාචාර්ය දර්ශන රත්නායක
තනුව හා සංයෝජනය : සංගීත විශාරද පිසාල් අවිෂ්ක ශ්‍රද්ධානරත්න



## 2. පදාර්ථයට පණ කවා

පදාර්ථයට පණ කවා

කුසේ සඟවලා

හෙමින් හෙමින් මා අඹා

ලොවට බිහි කලා ................ //

මගේ මෑණියනේ - දුකින් පිරි මුවේ

මා නිබඳ දන්නා - නිවන ඔබම වේ

පදාර්ථයට පණ කවා

මාතා යථා - නියං පුත්තන් කියා

මා ගයන ගාථා - ඔබට නිසිම වේ

ගායනය : විශාරද එඩ්වඩ් ජයකොඩි

පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා


සංගීත සංයෝජනය : තිස්සසිරි පෙරේරා



## 3. රත්තරන් දූවේ

රත්තරන් දූවේ අපේ රත්තරන් දූවේ
ඔබයි දිවිය අර්ථවත් කලේ
ගියදා පටන් ඉගිල කුරුළු කූඩුවෙන්
සංතෝෂයක් නෑ සිතේ

සංතෝෂයක් නෑ සිතේ
සංතෝෂයක් නෑ සිතේ
ගියදා පටන් ඉගිල කුරුළු කූඩුවෙන්
සංතෝෂයක් නෑ සිතේ



ඉගිලිලා ගියේ සමුගෙන අපේ කූඩුවෙන්
ඔබත් කූඩුවක් තනන්න නේ
ඉගිල්ලා ගොසින් තනපු කූඩුවත් අරන්
නැවත එන්න පියඹලා දූවේ

නැවත එන්න පියඹලා දූවේ
නැවත එන්න පියඹලා දූවේ
ඉගිල්ලා ගොසින් තනපු කූඩුවත් අරන්
නැවත එන්න පියඹලා දූවේ

හනික එන්න පියඹලා දූවේ
ඇවිත් යන්න එන්න් සුදු දූවේ


මුල් ගායනය : ආචාර්ය නන්දා මාලනී සහ ආචාර්ය රෝහණ වීරසිංහ
පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

# 4. කොයිද කියා මන්ද කියා

කොයිද කියා
මන්ද කියා
නොදැන ආවෙමී
දිවි ගමනේ මගේ යෙහෙළි
සොඳුර ඔබ විණී

පෙමෙහි රසත්
එහි එලයත් ඔබෙන් උගතමී
දිවි හිමියෙන්
හද බැතියෙන්
ඔබට පින් දෙමී

නොතිර ලෙවේ
විරහ දුකේ
අඳුර හිමි විණී
මරු කතරේ
සුළඟ ලෙසේ
තනි ව පිට වෙමී




මුල් ගායනය : අචාර්ය අමරසිරි පීරිස්
පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සංගීත සංයෝජනය : රංජිත් ප්‍රේමවීර

## 5. පෙම් සිනා - සුන් වුණා

පෙම් සිනා - සුන් වුණා
ඔබේ ඇසුර නැති උනා
ඔබට ජයම වේ
ඔබට සුව සැදේ

විහග ලොවක රස සොයා
ඈත පියඹලා
තැනූ රුවන් මාලිගා
දෙදරලා ගියා
ඔබට ජයම වේ
ඔබට සුව සැදේ

දෙවියො ඇයි ද මේ කලේ
මිහිර අද නැතේ
සොබා දහම වේ ද මේ
කරුමෙ දෝ මගේ
ඔබට ජයම වේ
ඔබට සුව සැදේ



මුල් ගායනය : ආචාර්ය වික්ටර් රත්නායක
පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සංගීත සංයෝජනය : ආචාර්ය වික්ටර් රත්නායක

## 6. රැදුරු තුරු වදුලේ

රැදුරු තුරු වදුලේ
තියුණු කටු අතරේ
දිලෙන සියුමැලියේ
ඔබයි ජීවන - සුවද දෙන්නේ
රෝස කුසුම මගේ

මා හදේ රන් සුමුගේ ඔබ තබලා
නිරන්තරේ රැකගතිමි පුබුදුවලා
සුවද විදිමින් ඉදිමි සැමදා
දෑස වැසෙන තුරා - දෑස වැසෙන තුරා

මිහිරී - රූ සිරී
මිහිරේ - ජනනියේ
සිත සැනසේ ඔබ දසුනේ
මුදුමතී - මුදුමතී
සිත සැනසේ ඔබ දසුනේ
රැදුරු තුරු වදුලේ.........



මුල් ගායනය : විශාරද සුනිල් එදිරිසිංහ
පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

## 7. ධනයට ඇයි දැඩි ආශා

ධනයට ඇයි දැඩි ආශා

චිතුරේ - ධනයට ඇයි දැඩි ආශා

කන්න අඳින්නට - ඉන්න හිටින්නට

ඇතිනම් මිතුරේ ඇයි වෙහෙසෙන්නේ

ධනයෙහි සැනසුම

නැත ගැබ් ගන්නේ

ධනයට ඇයි දැඩි ආශා

සත්‍යය - යුක්තිය

සෙනෙහස - නිදහස

ඇතිනම් මිතුරේ

මොනවද නැත්තේ

නැතිනම් මිතුරේ

මොනවද ඇත්තේ

ධනයෙහි සැනසුම

නැත ගැබ් ගන්නේ

ධනයට ඇයි දැඩි ආශා ....



මුල් ගායනය : පණ්ඩිත් අමරදේව


පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා

සංගීත සංයෝජනය : ආචාර්ය රෝහණ වීරසිංහ

## 8. සරසවියෙන් - ඉපැරණි කැලණියේ

සරසවියෙන් - ඉපැරණි කැලණියේ
වෙද වරමක් - අපටයි ලැබෙනුයේ
රෝ දුක් නිවන දහම
එය වේ අපේ දහම
මතු දා අපේ ජීවිතේ

කෙළවරක් දහමට තිබේ දෝ
තිබේ නම් එය දන්නවාදෝ
එතෙරක් නැතී - මෙතෙරක් නැතී
පතුලක් නැතී - සයුරක් වැනී



විදු බලයෙන් රෝ බල බිඳින්නේ
මුදු ගුණයෙන් සිත සතපවන්නේ
සුවයයි දුකයි - පොදු ඉරණමයි
සුව අනියතයි - ලෝදම එයයි

මුල් ගායනය : වෛද්‍ය පීඨයේ සිසුන් පිරිසක්
පද රචනය සහ තනුව : මහාචාර්ය කාලෝ ෆොන්සේකා
සංගීත සංයෝජනය : මහාචාර්ය ප්‍රදීප් රත්නායක

වෛද්‍ය පීඨය - කැලණිය විශ්වවිද්‍යාලය • மருத்துவ பீடம் - களனிப் பல்கலைக் கழகம் • Faculty of Medicine – University of Kelaniya